# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ඒ.පී.එම්.ඩී.එස්.
කරුණාරත්න
අංක 37
මහ අම්බලන්ගොඩ පාර,
අම්බලන්ගොඩ

<u>අභියාචක</u>

**අභියාචනා අංකය :**
**1056/2021**

එදිරිව

නගර සභාව -
අම්බලන්ගොඩ
අම්බලන්ගොඩ

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික)- සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක දු:ක අංක 071 6434061 ඔස්සේ සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ පරිපාලන නිලධාරි එච්.ඒ.ඩී.ඩී හෙට්ටිආරච්චි මිය (තොරතුරු නිලධාරි) සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය :** 2022.06.15, 2022.08.17

**තීරණය කළ දිනය :** 2022.08.17

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2020.05.14 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

1. *අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ පාරේ අංක 35/10 දරණ ස්ථානයේ M.W ලක්ෂ්මන් ද සිල්වා විසින් අංක BA 2019/45 දරණ ගොඩනැගිලි අයදුම්පතට අනුව ඉදිරිපත් කර ඇති සැලැස්ම (ඉදිරිපස පෙනුම, පැති පෙනුම, දික්කඩ, හරස්කඩ, බිම් සැලැස්ම, බිම් මහලේ සැලැස්ම, 1 මහලේ සැලැස්ම, 2 වන මහලේ සැලැස්ම ආදී වශයෙන්)*

2. *ඉහත සැලසුම අනුමත කිරීම පිළිබඳ ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍රය (නගර සභා ගොඩනැගිලි අයදුම්පතේ පිටු අංක 10,11 සහ 12)*

3. *ඉහත සැලසුමට අදාළව අධිකාරිගේ වාර්තාව (නගර සභා ගොඩනැගිලි අයදුම්පතේ පිටු අංක 20 සහ 21)*

4. *මෙම අංක BA 2019/45 ට අදාළව නගර සභාවේ සැලසුම් කමිටුවේ වාර්තා සටහන්*

5. *තාක්ෂණ නිලධාරීන් විසින් මෙම ඉදිකිරීමට අදාළව කරන ලද ස්ථානීය පරීක්ෂණ වාර්තා සටහන්*

මෙම තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් තොරතුරු නිලධාරි විසින් 2020.05.29 සහ 2020.06.16 වන දිනැති පහත ප්‍රතිචාර දක්වා ඇත.

<u>2020.05.29 වන දිනැති පිළිතුර</u>

> *උක්ත කරුණ සම්බන්ධව ඔබ විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු අයදුම්පතෙහි පසුපිට සඳහන් අංක 01,02,03,05 යන කරුණු වලට අදාළ වන තොරතුරු ඔබ වෙත නිකුත් කිරීමට පෙර අදාළ පුද්ගලයාගේ කැමැත්ත විමසීම සඳහා වන RTI 07 ආකෘති පත්‍රය ඔහු වෙත යොමුකර ඇත.*
>
> *02 එයට පිළිතුරු ලැබුණු පසු එම තොරතුරු ලබාදීම පිළිබඳ සලකා බැලිය හැකිවන අතර ලිපියේ අංක 04 යටතේ දක්වා ඇති BA 2019/45 අයදුම්පතට අදාළ සැලසුම් කමිටු වාර්තාවේ සහතික පිටපතක් රු.4/- ක මුදලක් ගෙවීමෙන් අනතුරුව ලබාදිය හැකි බව කාරුණිකව දන්වමි.*

<u>2020.06.16 වන දිනැති පිළිතුර</u>

> *ඔබ විසින් 2020.06.14 දින ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක 2020/09 දරන තොරතුරු ඉල්ලීමේ පනතේ 5 වන උපවගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් කර ඇති හේතු මත ප්‍රතික්ෂේප කරන බව දන්වමි.*
>
> *1.ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරුවලට අදාළ තැනැත්තන් විසින් එම තොරතුරු හෙළිදරව් කිරීමට විරුද්ධතාව ප්‍රකාශ කිරීම.*

මෙම පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2020.06.24 වන දින නම් කළ නිලධාරි වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර නම් කළ නිලධාරි විසින් 2020.07.13 වන දින පහත ප්‍රතිචාරය දක්වා ඇත.

> *ඔබගේ තොරතුරු අයදුම්පතෙහි සඳහන් අම්බලන්ගොඩ, මහඅම්බලන්ගොඩ පාර, අංක 35/10 දරණ ස්ථානයේ පදිංචි එම්.ඩබ්. ලක්ෂ්මන් ද සිල්වා මහතාට අයත් BA 2019/45 අංක දරණ ගොඩනැගිලි අයදුම්පතෙහි පසුපිට සඳහන් 1,2,3,5 අංකවලට අදාළ තොරතුරු හෙළිදරව් කිරීම අයිතිකරු විදෙස්ගතව ඇති බැවින් ඔහුගේ බිරිඳ විසින් ප්‍රතික්ෂේප කර ඇත.*
>
> *එබැවින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5(අ) වගන්තිය හා 29(2) ඇ වගන්තිය ප්‍රකාරව එම තොරතුරු ඔබ වෙත නිකුත් කිරීමට නොහැකි බව කාරුණිකව දන්වමි.*

මෙයින් අතෘප්තියට පත් අභියාචක 2020.10.13 වන දින කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය ඉදිරිපත් කර ඇත.

**සළකා බැලීම**

අද දින අභියාචකගේ සැළ කිරීම් වලට අනුව තොරතුරු ඉල්ලීමට අදාළ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් දැනටමත් පොදු අධිකාරිය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එකී නඩුව දැනටමත් විභාග වෙමින් පවතී. තොරතුරු ඉල්ලීමේ අන්තර්ගත වන ලේඛන සියල්ලම පොදු අධිකාරිය විසින් පවරා ඇති නඩුවට අදාළ ලේඛන බව පැහැදිලි වේ. එසේම මේ වන විටත් තොරතුරු ඉල්ලීමේ අංක 4 ට අදාළ තොරතුර අභියාචක වෙත පොදු අධිකාරිය විසින් මුදා හැර ඇත.

ඉදිරිපත් වී ඇති කරුණු සළකා බලන විට අභියාචකගේ තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය පනතේ 5 (අ) වගන්තිය සහ 29 (2) (ඇ) වගන්තිය අදාළ කර ගනිමින් සිදු කර ඇති නිගමනයට මැදිහත් වීමට ප්‍රමාණවත් හේතු ඉදිරිපත් වී නොමැත. එබැවින් මෙම කරුණු සළකා බලා ප්‍රමාණවත් අයුරින් පොදු අධිකාරිය විසින් ප්‍රතිචාර දක්වා ඇති බවට නිගමනය කරමින් මෙම අභියාචනා විමර්ශනය අවසන් කිරීමට තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.